ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
அனர்த்த முகாமைத்துவ நிலையம்
DISASTER MANAGEMENT CENTRE

අංක 120/2,
විද්‍යා මාවත,
කොළඹ 07

எண் 120/2
வித்யா மாவத்தை
கொழும்பு 07

No 120/2,
Vidya Mawatha,
Colombo 07

ඔබේ අංකය / உமது இல / Your No.

මගේ අංකය / எனது இல — DMC/ 08/ Weather Forecast

දිනය / திகதி — 2026.02.18

යුද්ධ හමුදාධිපති,

ගුවන් හමුදාපති,

නාවික හමුදාධිපති,

පොලිස්පති,

අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව,

සියලුම දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්,

**<u>පූර්ව අනතුරු ඇඟවීමේ නිවේදනයයි.</u>**

2026.02.18 වන දින 0530 පැයට කාලගුණ විද්‍යා දෙපාර්මේන්තුව විසින් නිකුත් කරන ලද කාලගුණ නිවේදනය හා බැදේ.

02. එබැවින් සිදුවිය හැකි ආපදා තත්ත්වයන් අවම කිරිමට / පාලනය කර ගැනිමට හා කළමනාකරණය කර ගැනිම සඳහා මෙම නිවේදනය අනුව කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

03. තවද එම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන නිවේදන පිළිබඳව විමසිලිමත්ව කටයුතු කරන මෙන් ද මෙම නිවේදන පිළිබඳ විස්තර ලබා ගැනිම සඳහා 117 දුරකථන අංකය අමතන ලෙසටද වැඩිදුර තාක්ෂණික උපදෙස් ලබා ගැනිම සඳහා **<u>කාලගුණ විද්‍යා දෙපාර්මේන්තුව</u>** සමඟ සම්බන්ධීකරණය වන ලෙසටද දන්වා සිටිමි.

හිරාන් තිලකරත්න
නියෝජ්‍ය අධ්‍යක්‍ෂ / රාජකාරීභාර නිලධාරී
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

# GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි

Issued by Forecasting Division, National Meteorological Centre

## 2026 පෙබරවාරි මස 18 දින සඳහා කාලගුණ අනාවැකිය
**2026 පෙබරවාරි මස 18 දින උදෑසන 05.30 ට නිකුත්කරන ලදි.**

උතුරු, උතුරු-මැද, මධ්‍යම, ඌව, නැගෙනහිර සහ දකුණු පළාත්වල විටින් විට වැසි ඇතිවේ. නැගෙනහිර සහ ඌව පළාත්වලත් පොලොන්නරුව, මාතලේ සහ නුවරඑළිය දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථානවලට **මිලිමීටර් 75 ට වැඩි තරමක තද වැසි** ඇති විය හැක.

සෙසු ප්‍රදේශවල ප. ව 1.00 න් පසු තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක.

මධ්‍යම සහ සබරගමුව පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථානවල අළුයම් කාලයේදී මීදුම් සහිත තත්ත්වයක් පැවතිය හැක.

**ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මගින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

## WEATHER FORECAST FOR 18 FEBRUARY 2026
**Issued at 05.30 a.m. on 18 February 2026**

Showers will occur at times in Northern, North-central, Central, Uva, Eastern and Southern provinces. **Fairly heavy falls above 75 mm** are likely at some places in Eastern and Uva provinces and in Polonnaruwa, Matale and Nuwara-Eliya districts.

Showers or thundershowers will occur at several places elsewhere after 1.00 p.m.

Misty conditions can be expected at some places in Central and Sabaragamuwa provinces and in Galle and Matara districts during the early hours of the morning.

**The general public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershower**

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව**

**வளிமண்டலவியல் திணைக்களம்**

**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk


ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

## GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි

Issued by Forecasting Division, National Meteorological Centre

**ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය**

**2026 පෙබරවාරි මස 18 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.**

| |
|---|
| **ශ්‍රී ලංකාවට ගිනිකොන දෙසින් දකුණු බෙංගාල බොක්කේ මධ්‍යම මුහුදු ප්‍රදේශයේ අඩු පීඩන කලාපය තවදුරටත් පවතී. මේ සම්බන්ධයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ඉදිරි අනාවැකි සහ නිවේදන පිළිබඳව අවධානයෙන් පසුවන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.** |
| **වැසි තත්ත්වය:** |
| ගාල්ල සිට හම්බන්තොට සහ මඩකලපුව හරහා ත්‍රිකුණාමලය දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල සවස් කාලයේ හෝ රාත්‍රී කාලයේදී ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක. |
| **සුළඟ:** |
| සුළං ඊසාන දිශාවෙන් හමා එන අතර සුළඟේ වේගය **පැ.කි.මී. (30-40)** පමණ වේ. කළුතර සිට පුත්තලම හරහා මන්නාරම දක්වා සහ මාතර සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට **පැ.කි.මී. 50** දක්වා වැඩි විය හැක. |
| **මුහුදේ ස්වභාවය:** |
| කළුතර සිට පුත්තලම හරහා මන්නාරම දක්වා සහ මාතර සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ විටින් විට රළු වේ. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශ මද වශයෙන් රළු වේ.<br>**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.** |

**WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS**

**Issued at 05.30 a.m. on 18 February 2026**

| |
|---|
| **The low-pressure area still persists over the central parts of south Bay of Bengal to the south east of Sri Lanka. Navel and fishing communities are requested to be attentive to the future forecasts and bulletins issued by the Department of Meteorology in this regards.** |
| **Condition of Rain:** |
| Showers or thundershowers will occur at times in the sea areas off the coast extending from Galle to Trincomalee via Hambantota and Batticaloa. Showers or thundershowers may occur at a few places in the other sea areas around the island in the evening or night. |
| **Winds:** |
| Winds will be north-easterly and wind speed will be **(30-40) kmph**. Wind speed can increase up to **50 kmph** at times in the sea areas off the coast extending from Kaluthara to Mannar via Puttalam and from Matara to Pottuvil via Hambantota. |
| **State of Sea:** |
| The sea areas off the coast extending from Kaluthara to Mannar via Puttalam and from Matara to Pottuvil via Hambantota will be rough at times. Other sea areas around the island will be moderate.<br>**Temporarily strong gusty winds and very rough seas can be expected during thundershowers.** |

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි